පරිපාලන චක්‍රලේඛ අංක. 10/89(i)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1989 අප්‍රේල් මස 24 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

අතුරු පියවරක් වශයෙන් රජයේ නිලධාරීන් අමාත්‍යාංශ/
දෙපාර්තමේන්තු වල සිට පළාත් සභාවලට තාවකාලිකව
මුදාහැරීම.

1989.02.09 දිනැති අංක. 10/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02. පළාත් සභාවකට තාවකාලිකව මුදාහරිනු ලබන නිලධරයෙකු පහත සඳහන් කරුණුවලට යටත් වේ.

(අ) එසේ මුදාහරින ලද නිලධරයා දැනට අයු දරමින් පළාත් සභාවට පවරන විෂය කොටසක් ඉටුකිරීමේ කාර්යයේ යෙදී සිටිය යුතුය.

(ආ) තාවකාලික මුදාහැරීමේ කාලය අවුරුද්දක් වේ.

(ඇ) අදාළ නිලධරයා තාවකාලික මුදාහැරීමට කැමති විය යුතු අතර ඔහුට එසේ තාවකාලිකව මුදාහරින ලෙස පළාත් සභාව ඉල්ලිය යුතුය. (අදාළ ආකෘතිය අමුණා ඇත.)

(ඈ) පළාත් සභාවකට තාවකාලිකව මුදාහරින ලද නිලධරයාගේ සේවා නියමයන් හා කොන්දේසි වෙනස් නොවී පවතිනු ඇත.

(ඉ) තාවකාලිකව මුදාහරින ලද කාලය තුළදී ද නිලධරයාට රජය විසින් පවරනු ලබන රාජකාරි ඉටු කිරීමට සිදුවේ.

(ඊ) තාවකාලිකව මුදාහරින ලද කාලය තුළ නිලධරයා අතිරේක ගෙවීම් නොලබන්නේය.

(උ) පළාත් සභාවේ රාජකාරි කටයුතු කිරීම සඳහා තාවකාලික පත්වීමේ ලිපියක් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිලධරයා තාවකාලිකව මුදාහරිනු ලබන අවස්ථාවේදී ඔහුට නිකුත් කරනු ඇත. (අදාළ ආකෘතිය අමුණා ඇත.)

03. පළාත් සභාවල කාර්ය ඇරඹීම සඳහා එක් එක් සේවා වර්ග වලින් අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් මේ වනවිට ගණන් බලා තිබේ. තමාට අවශ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරයක් ඔහු දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ඇත. ඉන්පසුව ඉහත 2 ඡේදයේ අඩංගු නියමයන්ට අනුකූලව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් විමසා බලා පළාත් සභාවට නිලධරයන් මුදාහැරීමට දිසාපතිවරයා විසින් පියවර ගනු ලබනු ඇත.

04. වැටුප් ගෙවීම සඳහා පළාත් සභාවට රජයෙන් මුදල් ප්‍රදානය කරන තෙක් නිලධරයා දැනට ඔහුගේ වැටුප් හා දීමනා ලබාගන්නා බලධාරියාගෙන් ලබාගනු ඇත.

05. දිස්ත්‍රික්කයේ සිටින ඔබගේ නිලධරයන්ගේ තාවකාලික මුදාහැරීම පිළිබඳ ඉහත දැක්වෙන පරිපාටිය අනුව අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලමි.

06. මෙම චක්‍රලේඛයට අමුණා ඇති ආදර්ශ ලිපිය, 1989 පෙබරවාරි 09 දිනැති අංක 10/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමුණා ඇති මුදාහැරීමේ ආදර්ශ ලිපිය වෙනුවට ආදේශ කරනු ලැබේ.

07. මෙම පරිපාටිය පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන කිසිම නිලධරයෙකුට අදාළ නොවේ.

(සිරිල් ගමගේ)
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

## පළාත් රාජ්‍ය සේවා කොමිසම විසින් සේවයේ නියුක්ත කරනු ලැබීමේ ආදර්ශ ලිපිය

........................ මහතා/මහත්මිය/
මෙනවිය.

........................

### පළාත් රජයේ සේවයෙහි තාවකාලිකව පත්කිරීම

........................ පළාත් සභාවේ සේවය සඳහා ඔබ මුදාහරිමින් ........................ විසින් එවන ලද අංක ........ ................ හා ........................ දින දරන ලිපිය හා බැඳේ.

ඔබ 198........................ දින සිට එක් අවුරුද්දක කාලයක් සඳහා පළාත් රජයේ සේවයෙහි තාවකාලිකව පත්කිරීමට ........................ පළාත් රාජ්‍ය සේවා කොමිසම සතුටුවී ඇති බව ඔබවෙත දැනුම් දීමට මට නියෝග කර තිබේ.

මෙම තාවකාලික පත්වීම හේතුකොට ගෙන පළාත් රජයේ සේවයට ස්ථිර පත්වීමක් ලබාගැනීමේ අයිතිවාසිකම ස්වයංක්‍රීය වශයෙන් ඔබට හිමි නොවන බව කරුණාවෙන් සැලකුව මැනවි.

ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිසම
.............. පළාත.

........................ මහතා

(නම)

........................

(තනතුර)

**අතුරු පියවරක් වශයෙන් රජයේ නිලධරයන් අමාත්‍යාංශවලින්/ දෙපාර්තමේන්තුවලින් පළාත් සභාවලට මුදාහැරීම**

1989.04.24 ...... දින අංක 10/89 (1) දරන රා.ප.චි.

චක්‍රලේඛය හා සම්බන්ධවයි.

02. 89.02.09 දින අංක 10/89 හා 89.04.24 දින අංක 10/89(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති නියමයන් හා කොන්දේසි ප්‍රකාර අතුරු පියවරක් වශයෙන් සේවය කිරීම සඳහා ........................ පළාත් සභාවට මුදාහරිනු ලැබීමට ඔබ කැමති ද යන බව මෙහි පහත සඳහන් ආකාරයෙන් සඳහන් කර දන්වනු මැනවි.

........................

දෙපාර්තමේන්තු ප්‍රධානියා.

........................................ වන මම අතුරු පියවරක් වශයෙන් ........................ පළාත් සභාවට මුදාහරිනු ලැබීමට කැමති/අකමැති බව මෙයින් දන්වා සිටිමි.

........................

අත්සන

දිනය: ........................